| | | |
|---|---|---|
| 29 | S | I |

# ST. SEBASTIAN'S COLLEGE – MORATUWA
# සාන්ත සෙබස්තියන් විදුහල - මොරටුව

13 වන ශ්‍රේණිය - පළමු වාර පරීක්ෂණය
Grade 13 – 1st Term Test – 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I
Communication & Media Studies - I

කාලය පැය 02 යි
Two Hours

නම :- ........................................................... පන්තිය :- ............... පන්ති අංකය :- ...............

**උපදෙස් :-**

- **මෙම කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**
- **1 - 50 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. සංකේත යනු,
   (i) බොහෝ දෙනා තුළ එකම අර්ථය ජනනය කරන්නකි.
   (ii) වෙනත් යමක් නියෝජනය කරන දෙයකි.
   (iii) නිර්වාචික සන්නිවේදනයට අදාළ වූවකි.
   (iv) පුද්ගලයන් නොව අදහස් නියෝජනය කරන්නකි.
   (v) කථන සන්නිවේදනයට පරිබාහිර දෙයකි.

2. පොතක් කියවන විට හමු වූ නුහුරු වචනයක අර්ථය හරි හැටි දැන ගැනීමට කමලා ශබ්දකෝෂය විමසා බලයි. මෙය,
   (i) පරිවර්තන අවස්ථාවකි.
   (ii) විකේතකරණ අවස්ථාවකි.
   (iii) ද්වි මාර්ගික අවස්ථාවකි.
   (iv) අර්ථකථනයකි.
   (v) සංජානනයකි.

3. සන්නිවේදනය රේඛීය ලෙස ක්‍රියාත්මක වන්නේ,
   (i) සන්නිවේදකයා, මාධ්‍ය, බලපෑම හා ග්‍රාහකයා තුළිනි.
   (ii) මූලාශ්‍රය, නාලිය, ආකේතකරණය හා ප්‍රතිචාරය මගිනි.
   (iii) සන්නිවේදකයා, බාධක, ප්‍රතිපෝෂණය හා බලපෑම මගිනි.
   (iv) සන්නිවේදකයා, ග්‍රාහකයා, මූලාශ්‍රය හා මාධ්‍ය තුළිනි.
   (v) සන්නිවේදකයා, සංදේශය, මාධ්‍ය හා ග්‍රාහකයා තුළිනි.

4. ජනමාධ්‍ය මගින් සිදුවන සන්නිවේදනයේ දී අනිවාර්ය සාධකයක් නොවන්නේ,
   (i) දොරටුපාල කාර්යයයි.
   (ii) තාක්ෂණික විධික්‍රම භාවිතයයි.
   (iii) ද්වි මාර්ගික බවකින් යුක්ත වීමයි.
   (iv) පොදු සංදේශ විසරණයයි.
   (v) ධූරාවලියක් සහිත ආයතනික රටාවයි.

5. සමාජ සංවිධානය, ජනමතය හා ජනතාව හා ඔවුන්ගේ ගැටලු යන කෘතීන් රචනා කරන ලද්දේ පිළිවෙලින්,
   (i) චාල්ස් කූලි, විල්බර් ශ්‍රාම්, ලැස්වෙල්
   (ii) ලැස්වෙල්, කාල් මාක්ස්, විල්බර් ශ්‍රාම්
   (iii) චාල්ස් කූලි, වෝල්ටර් ලිප්මාන්, ජෝන් ඩුවී
   (iv) ජෝන් ඩුවී, චාල්ස් කූලි, වෝල්ටර් ලිප්මාන්
   (v) වෝල්ටර් ලිප්මාන්, විල්බර් ශ්‍රාම්, චාල්ස් කූලි

Artsapi.lk

6. සන්නිවේදන විෂය ප්‍රථම වරට ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ආයතනය,
   (i) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
   (ii) දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය
   (iii) කැළණිය විශ්වවිද්‍යාලය
   (iv) කොළඹ විශ්වවිද්‍යාලය
   (v) ශ්‍රීපාලි මණ්ඩපය

7. උසස් පෙළ කලා විෂය ධාරාවට සන්නිවේදන විෂය හඳුන්වා දෙනු ලැබුවේ,
   (i) 2006 (ii) 2007 (iii) 2008 (iv) 2009 (v) 2005

8. කැළණිය විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශය ආරම්භ කරනු ලැබුවේ,
   (i) 1975 (ii) 1978 (iii) 1973 (iv) 1982 (v) 1972

9. HUB ආකෘතියට අදාළ සාධකයක් නොවන්නේ,
   (i) අකේතකරණය
   (ii) බලපෑම්
   (iii) සංඥා
   (iv) ජනමාධ්‍ය
   (v) පෙරහනු

10. නිර්වාචික සන්නිවේදනයට අදාළ ප්‍රභේදයක් නොවන්නේ,
   (i) ශ්‍රව්‍ය සංඥා
   (ii) දෘශ්‍ය සංඥා
   (iii) පෝස්ටර්
   (iv) චිත්‍ර
   (v) කාටූන්

11. දෛනික ජීවිතයට වඩාත් සමීප සන්නිවේදන ස්වරූපය වන්නේ,
   (i) කථන සන්නිවේදනය
   (ii) ජන සන්නිවේදනය
   (iii) වාචික සන්නිවේදනය
   (iv) ලිඛිත සන්නිවේදනය
   (v) අකථ්‍ය සන්නිවේදනය

12. "තොරතුරු ගැබ් වූ සංඥාවක් කරණකොටගෙන දෙපාර්ශ්වයක් අතර එක සමාන මනෝ වෘත්තියක් ඇති කරලීම, සන්නිවේදනය යි."
   (i) හැරල්ඩ් ඩී. ලැස්වෙල්
   (ii) විල්බර් ශ්‍රාම්
   (iii) ෂැනන් හා වීවර්
   (iv) චාල්ස් කූලි
   (v) එඩ්වඩ් සැපියර්

13. මුල් වරට බාධක තත්ත්වයන් හඳුන්වා දුන් ආකෘතිය වන්නේ,
   (i) ෂැනන් හා වීවර් ආකෘතිය
   (ii) HUB ආකෘතිය
   (iii) ලැස්වෙල් ආකෘතිය
   (iv) ඇරිස්ටෝටල් ආකෘතිය
   (v) විල්බර් ශ්‍රාම් ආකෘතිය

14. සන්නිවේදනයේ දී බලපෑම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලද්දේ,
   (i) ඇරිස්ටෝටල් ආකෘතිය
   (ii) ලැස්වෙල් ආකෘතිය
   (iii) ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතිය
   (iv) HUB ආකෘතිය
   (v) ෂැනන් - වීවර් ආකෘතිය

15. සන්නිවේදන ආකෘති මගින් සිදු කරන කාර්යයක් නොවන්නේ,
   (i) තොරතුරු ගලායාම පෙන්වීම.
   (ii) මාධ්‍ය ක්‍රියාවලිය සිදුවන ආකාරය පෙන්වීම.
   (iii) සන්නිවේදන ස්වභාවය, අවශ්‍යතාවය හඳුන්වා දීම.
   (iv) සමාජ සුභ සාධනයක් කිරීම.
   (v) සන්නිවේදකයාගේ හා ග්‍රාහකයාගේ ස්වරූප පෙන්වීම.

ArtsApi.lk

16. ජනමාධ්‍යයේ අන්තර්ගත සාම්ප්‍රදායික මාධ්‍යයට වඩා සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
   (i) ගැමියාට සමීප වීම.
   (ii) විෂම ජනනීය ග්‍රාහකයින් සිටීම.
   (iii) සරල භාවිතය
   (iv) නම්‍යශීලීත්වය
   (v) සංස්කෘතික අංග හුවමාරු කිරීම.

17. මානව සන්නිවේදනය පිළිබඳව නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.
   (i) වැඩි වශයෙන් නිර්වාචික සන්නිවේදනය යොදා ගනී.
   (ii) එකවර නාලිකා කිහිපයක් පාවිච්චි කළ හැකි ය.
   (iii) වර්තමානයට පමණක් සීමාවනු පෙනේ.
   (iv) සංස්කෘතිය මගින් පාලනය වන්නකි.
   (v) සන්දර්භයට අනුව වෙනස් වේ.

18. ජන මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කෙරෙන තොරතුරු පිළිබඳ තීන්දු තීරණ ගන්නේ,
   (i) හිමිකරුවන් ය.
   (ii) සංස්කාරකවරුන් ය.
   (iii) වාර්තාකරුවන් ය.
   (iv) දොරටු පාලකයන් ය.
   (v) නිසි බලධරයන් ය.

19. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   (i) කථන සන්නිවේදන තුළ වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකි ය.
   (ii) ලිඛිත සන්නිවේදනය තුළ නිර්වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකි ය.
   (iii) කථන සන්නිවේදනය තුළ නිර්වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකි ය.
   (iv) ලිඛිත සන්නිවේදනය තුළ වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකි ය.
   (v) ලිඛිත සන්නිවේදනය තුළ කථන සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකි ය.

20. අර්ථ බාධකවලට තුඩු දිය හැකි ප්‍රධාන සාධකයක් වීමට වඩාත් ම ඉඩ ඇත්තේ මින් කවර ගැටලුවක් ද?
   (i) පණිවිඩ සම්ප්‍රේෂණය
   (ii) නාලිකාව තීරණය කිරීම
   (iii) සංකේත තෝරා ගැනීම
   (iv) තාක්ෂණික විෂමතා
   (v) ග්‍රාහක දුර්වලතා

21. ග්‍රාමීය සන්නිවේදනය සඳහා සාම්ප්‍රදායික මාධ්‍ය යොදා ගැනීමේ ඇති වාසියක් වන්නේ ග්‍රාහකයා හා මනා සන්නිවේදනයක් පවත්වාගෙන යාමයි. මින් ග්‍රාහක සහභාගීත්වය දිරිමත් කිරීමට අදාළ නොවන්නේ,
   (i) ප්‍රාදේශීය භාෂා හා එහි භාවිතය පිළිබඳ අවබෝධයයි.
   (ii) ද්විමාර්ගික සන්නිවේදනයක් පවත්වාගෙන යාමයි.
   (iii) ග්‍රාහක අත්දැකීම් පසුතලය පිළිබඳ අවබෝධයයි.
   (iv) ග්‍රාහකයන්ගේ විශ්වාස, වටිනාකම් සමඟ ගැටීමක් ඇති නොකිරීමයි.
   (v) ග්‍රාහක ප්‍රතිපෝෂණය පිළිබඳ නොසලකා හැරීමකි.

22. පහත තත්ත්ව අතුරෙන් අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට වඩාත් ගැළපෙන නිදසුන වන්නේ,
   (i) සිහින දැකීමයි.
   (ii) හෘදය සාක්ෂියයි.
   (iii) කේන්තියයි.
   (iv) කටපාඩමයි.
   (v) අත්දැකීමයි.

ArtSapik

23. වර්තමාන ශ්‍රී ලංකාවේ නව මාධ්‍යයේ ව්‍යාප්තිය සහ බලපෑම නිසා පොදු ජන ජීවිතයේ සැලකිය යුතු පරිවර්තනයක් සිදුවෙමින් පවතී. මෙහි දී මූලිකව දෘශ්‍යමාන වන්නේ,
(i) සංස්කෘතික විසරණයකි.
(ii) සංස්කෘතික පරිහානියකි.
(iii) සංස්කෘතික සම්පර්කයකි.
(iv) සංස්කෘතික ත්වරණයකි.
(v) සංස්කෘතික ආක්‍රමණයකි.

24. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(i) සමූහ සන්නිවේදනයක් සිදු වන්නේ ද යන්න හුදු ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් තීරණය වන්නකි.
(ii) කුඩා කණ්ඩායම් සන්නිවේදනයට වඩා විශාල කණ්ඩායම් සන්නිවේදනය කෙරෙහි නායකත්ව සාධකය වැඩි බලපෑමක් ඇති කරයි.
(iii) සමූහයක් තුළ කණ්ඩායම් සන්නිවේදනය මෙන් ම පුද්ගලාන්තර සන්නිවේදනය ද සිදු විය හැකි ය.
(iv) සමූහ සන්නිවේදනය ඒකමාර්ගික හෝ ද්විමාර්ගික ස්වභාවයක් ඉසිලිය හැකි ය.
(v) පුද්ගලාන්තර සන්නිවේදනයට වඩා නායකත්ව සාධකය වැදගත් වන්නේ කණ්ඩායම් සන්නිවේදනයේ දී ය.

25. ජනමාධ්‍ය,
A. තොරතුරු සන්නිවේදනයට ප්‍රමුඛතාව ලබා දිය යුතුය.
B. විනෝදය සඳහා යම් ඉඩකඩක් වෙන් කළ යුතුය.
C. බොහෝවිට දැන්වීම්කරණය මත පදනම් විය යුතුය.
D. රටක සංවර්ධන ක්‍රියාවලියට දායක විය යුතුය.
E. සමාජය පිළිබඳ සුපරීක්ෂාකාරී විය යුතුය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(i) A, B හා C පමණි.
(ii) A, B හා D පමණි.
(iii) A, C හා E පමණි.
(iv) A, B, D හා E පමණි.
(v) A, B, C, D හා E යන සියල්ලම ය.

26. මාධ්‍ය මගින් ඉදිරිපත් කරන තොරතුරු ස්වභාවය මූලික වශයෙන්,
(i) විචාරාත්මක ය.
(ii) නිර්මාණාත්මක ය.
(iii) උත්පාදනාත්මක ය.
(iv) සම්ප්‍රේක්ෂණාත්මක ය.
(v) පරිකල්පනාත්මක ය.

27. නිර්වාචික සන්නිවේදනයේ ඇති වැදගත්කම පිළිබඳ පන්ති කාමරයේ දී විවිධ අදහස් මතු විය.
- රාජා - දෙදෙනෙක් අතර කතාබහක දී අතින් ඇල්ලීමත් නිර්වාචික සන්නිවේදනයක්ද
- ගීතා - මුහුණින් හා ඇස්වලින් කරන ප්‍රකාශත් වැදගත්
- කමල් - මම නම් හිතන්නේ වඩා වැදගත් ඇඳුම හා පෙනුමයි.
- ජානකී - ඒත්, කතාබහේ දී වචන උච්චාරණය හා හඬ උස් පහත් කිරීමත් වැදගත්

ඉහත ප්‍රකාශ අතුරෙන් නිර්වාචික සන්නිවේදනය හා ගැළපෙන අදහස් ප්‍රකාශ කරන්නේ,
(i) රාජා හා ගීතා පමණි.
(ii) ගීතා, කමල් හා ජානකී පමණි.
(iii) රාජා, ගීතා හා කමල් පමණි.
(iv) රාජා, කමල් හා ජානකී පමණි.
(v) රාජා, ගීතා, කමල් හා ජානකී පමණි.

Artsapi.lk

28. ආපදා කළමනාකරණයේ දී මාධ්‍යකරුවාගේ භූමිකාව පිළිබඳ පාසල් මාධ්‍ය සමාජයේ දී සාකච්ඡාවක් මතු විය.

- රහීම් - අදාළ ස්ථානයට ගියවිට සිදුවීම පිළිබඳ මූලික තක්සේරුවක් ලබාගත හැකියි.
- රවී - සිද්ධිය වූ අවස්ථාවේ දී එහි සිටි සිද්ධිය විස්තර කළ හැකි ඇසින් දුටුවන් සොයා ගත යුතුයි.
- රෙජී - මාධ්‍ය මගින් විකාශය කිරීමට හෝ මුද්‍රණයට පෙර මියගිය හා තුවාල ලැබුවන්ගේ ගණන සැමවිට ම නැවත පරීක්ෂා කර බැලිය යුතුයි.
- රොහාන් - තුවාල ලැබූ හා වේදනාවට පත්වූවන්ට උදව් කිරීමට වඩා, ඒ අයගේ තොරතුරු උණුසුම් පුවත් ලෙස ඉදිරිපත් කළ හැකිය.

ඉහත කරුණු අතුරෙන් ආපදා වාර්තාකරණයේ දී ජනමාධ්‍යකරුවන්ගේ වගකීම හා අදාළ වන අදහස් ඉදිරිපත් කරන්නේ,

(i) රොහාන්, රෙජී හා රහීම් ය.
(ii) රොහාන්, රවී හා රහීම් ය.
(iii) රවී, රෙජී හා රහීම් ය.
(iv) රොහාන්, රවී හා රෙජී ය.
(v) රොහාන්, රවී, රෙජී හා රහීම් යන සියලු දෙනාම ය.

29. නාම ලේඛනය ලකුණු කරමින් සිටි ගුරුවරයා හිසින් සන්කොට සිසුන් අතරින් එක් සිසුවෙකු තමා වෙත කැඳවා ගත්තේ ය. එකී සිදුවීම තුළින් වඩාත් ප්‍රකට වන සන්නිවේදන ප්‍රභේදය හා ස්වරූපය සහිත වරණය තෝරන්න.

(i) අන්තර් පුද්ගල හා දෘශ්‍ය සන්නිවේදනය
(ii) අන්තර් පුද්ගල හා නිර්වාචික සන්නිවේදනය
(iii) අන්තර්වර්ති පුද්ගල හා අව්ධිමත් සන්නිවේදනය
(iv) අන්තර්වර්ති පුද්ගල හා නිර්වාචික සන්නිවේදනය
(v) සමූහ හා අවිධිමත් සන්නිවේදනය

Artsapi.lk

30. "ඇසූ දුටු දේ කියූ ලියූ දේට වඩා මතකයේ රැඳෙන බව" පැවසූ ගුරුතුමියගේ ප්‍රකාශයෙන් ධ්වනිත නොවන සන්නිවේදන ස්වරූපය වන්නේ,

(i) ශ්‍රව්‍ය සන්නිවේදනය
(ii) දෘශ්‍ය සන්නිවේදනය
(iii) වාචික සන්නිවේදනය
(iv) අවාචික සන්නිවේදනය
(v) ලිඛිත සන්නිවේදනය

31. අවාචික සන්නිවේදනයට අයත් අංශ ලෙස සිසුන් සය දෙනෙකු දැක්වූ පිළිතුරු කිහිපයක් මෙසේ ය.

- විජිත - පෙනුම හා ඇඳුම
- රජිත - කථන වේගය, හඬ රටාව හා රිද්මය
- අජිත - නිහඬතාව, අවකාශය හා පරිසරය
- මධුර - වාක්‍යාංශ, වාක්‍ය
- මිහිර - කායික හැසිරීම්, ඉරියව්, ඉඟි, මුහුණේ භාව
- අනුර - චිත්‍ර, රූප සටහන් හා සංඛ්‍යාත රූප

ඉහත පිළිතුරු අතුරින් පිළිගත නොහැකි පිළිතුරු ඉදිරිපත් කර ඇත්තේ,

(i) මධුර පමණි.
(ii) විජිත හා අජිත ය.
(iii) රජිත හා මධුර ය.
(iv) මධුර හා අනුර ය.
(v) මිහිර හා මධුර ය.

32. වස්කවි හා සෙත්කවි අයත් වන්නේ,

(i) ජන ක්‍රීඩාවලට ය. (ii) ජන ආගම්වලට ය. (iii) ජන රංගවලට ය. (iv) යාතු කර්මවලට ය. (v) ජන වෙදකමට ය.

33. වර්තමානයේ ඉතා ජනප්‍රිය මුද්‍රණ ක්‍රමය වන්නේ,

(i) උත්තල මුද්‍රණය (ii) තිර මුද්‍රණය (iii) අංකිත මුද්‍රණය (iv) සමතල මුද්‍රණය (v) ඕෆ්සෙට් මුද්‍රණය

34. නව ලිබරල්වාදයෙහි පදනම වන්නේ,

(i) කාර්මීකරණයයි (ii) නවීකරණයයි (iii) ගෝලීයකරණයි (iv) නාගරීකරණයයි (v) වාණිජකරණයයි

35. පුද්ගලාන්තර හා සමූහ සන්නිවේදන නිපුණතා අතරට අයත් වනුයේ.

(i) එලදායී කථනය (ii) සහානුභූතිය (iii) සම්මුඛ සාකච්ඡා (iv) විසම්මුතිය හා එකඟත්වය (v) ආචාරශීලීත්වය

36. සන්නිවේදකයා හා ග්‍රාහකයාගේ අඛණ්ඩ සම්බන්ධතාවය විවරණය කරන සන්නිවේදන ආකෘතිය,

(i) ලැස්වෙල් ආකෘතියයි. (ii) ෂැනන් - වීවර් ආකෘතියයි. (iii) ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතියයි. (iv) බර්ලෝ ආකෘතියයි. (v) විල්බර් ශ්‍රාම් ආකෘතියයි.

37. අධි තාක්ෂණය අනිවාර්ය වන අවස්ථාවකි,

(i) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය (ii) අන්තර් පුද්ගල සන්නිවේදනය (iii) කණ්ඩායම් සන්නිවේදනය (iv) ජන සන්නිවේදනය (v) විධිමත් සන්නිවේදනය

38. අන්තර් පුද්ගල සන්නිවේදනය බොහෝ විට,

(i) ශ්‍රව්‍ය - කථන සන්නිවේදනයේ එකතුවකි.
(ii) වාචික - නිර්වාචික සන්නිවේදනයේ එකතුවකි.
(iii) දෘශ්‍ය - වාචික සන්නිවේදනයේ එකතුවකි.
(iv) ශ්‍රව්‍ය - දෘශ්‍ය සන්නිවේදනයේ එකතුවකි.
(v) විධිමත් - අවිධිමත් සන්නිවේදනයේ එකතුවකි.

39. නූතන ජනමාධ්‍යවල තාක්ෂණික පදනමේ ප්‍රාරම්භකයා වූයේ,

(i) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් ය. (ii) සායි ලුන් ය. (iii) ජොහැන්නස් ගුටෙන්බර්ග් ය. (iv) මාෂල් මැක්ලූහන් ය. (v) තෝමස් අල්වා එඩිසන් ය.

40. බාහිර උපකරණ භාවිතය අවශ්‍ය නොවන සන්නිදෙවින වර්ගය වන්නේ,

(i) අන්තර්පුද්ගල සන්නිවේදනයයි (ii) අන්තර්වර්තී සන්නිවේදනයයි. (iii) සමූහ සන්නිවේදනයයි. (iv) නිර්වාචික සන්නිවේදනයයි. (v) අවිධිමත් සන්නිවේදනයයි.

Artsapi.lk

41. සන්නිවේදන මූලිකාංගවලට අයත් නොවන්නේ,

(i) මූලාශ්‍ර ය. (ii) බාධක ය. (iii) ප්‍රතිපෝෂණ ය. (iv) දොරටු පාලක ය. (v) නාලිය ය.

42. තොරතුරු ආකේතකරණයට ලක් කිරීම සන්නිවේදන ක්‍රියාවලියේ දී අත්‍යවශ්‍ය අංගයක් බව ප්‍රථම වරට පෙන්වා දෙන ලද්දේ,

(i) ෂැනොන් හා වීවර් ය.
(ii) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් ය.
(iii) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
(iv) මාෂල් මැක්ලූහන් ය.
(v) ආතර් සී. ක්ලාක් ය.

43. පණිවිඩය නිසි ලෙස වටහා ගැනීමට බලපානු ලබන පරිසර සාධක මූලිකාංගයකි.

(i) අත්දැකීමේ පසුතලය (ii) ආකේතකරණය (iii) පණිවිඩය (iv) ප්‍රතිපෝෂණය (v) විකේතකරණය

44. ප්‍රතිපෝෂණ ක්‍රියාවලියේ වාසි මෙසේ ය.

A. සංදේශය ලැබුණේ ද යන්න දැන ගැනීම.
B. අඩුපාඩු සකසා ප්‍රතිසංවිධානය
C. සන්නිවේදක හැකියා වර්ධනය
D. ග්‍රාහක දක්ෂතා හැඩවීම

මින් නිවැරදි වන්නේ,

(i) A හා B පමණක් නිවැරදි ය.
(ii) B හා C පමණක් නිවැරදි ය.
(iii) C හා D පමණක් නිවැරදි ය.
(iv) B හා D පමණක් නිවැරදි ය.
(v) A හා C පමණක් නිවැරදි ය.

45. ප්‍රතිචාර ප්‍රමාද වීම අදාළ වන සන්නිවේදන වර්ග වන්නේ,

(i) සමූහ සන්නිවේදනය
(ii) ජන සන්නිවේදනය
(iii) සමූහ සන්නිවේදනය හා ජන සන්නිවේදනය
(iv) අන්තර්වර්ති සන්නිවේදනය
(v) අන්තර්පුද්ගල සන්නිවේදනය

46. දැඩි සුළඟ හා විදුලි කෙටීම නිසා රූපවාහිනිය නැරඹිය නොහැකි විය. මෙය,

A. මාධ්‍ය බාධකයකි B. පරිසර බාධකයකි C. අර්ථ බාධකයකි

මින් නිවැරදි වන්නේ,

(i) A පමණකි. (ii) B පමණකි. (iii) C පමණකි. (iv) A හා B පමණකි. (v) B හා C පමණකි.

47. ප්‍රක්ෂේපනීය උපකරණ,

A. උඩිස් ප්‍රක්ෂේපන යන්ත්‍රය
B. ක්ෂණික ප්‍රක්ෂේපන යන්ත්‍රය
C. පිටු පෙරලනය
D. ෆැනල් පුවරුව
E. පරිගණකය

මින් නිවැරදි වන්නේ,

(i) A හා B පමණක් නිවැරදි ය.
(ii) A හා C පමණක් නිවැරදි ය.
(iii) D හා E පමණක් නිවැරදි ය.
(iv) A, B හා C පමණක් නිවැරදි ය.
(v) A, B හා E පමණක් නිවැරදි ය.

Artsapi.lk

48. ඵලදායී කථනයක දී නොකළ යුතු දෙයකි.
    (i) කථනය සමග ඉඟි, ඉරියව්, සංඥා යොදා ගැනීම.
    (ii) ආවේගශීලි වීම.
    (iii) ධනාත්මක ප්‍රතිචාර දැක්වීම.
    (iv) ග්‍රාහකයාට තේරුම් ගත හැකි වේගයෙන් කතා කිරීම.
    (v) තමන්ට විශ්වාසයක් ඇති තමන් දන්නා දේවල් පමණක් කතා කිරීම.

49. දොරටු පාලකයන් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    (i) ජන මාධ්‍යයන් හි සන්දේශ පාලනය කරනු ලබයි.
    (ii) සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සිදුවන ක්‍රියාදාමයක් පාලනය කරයි.
    (iii) සෑම ජන මාධ්‍ය ආයතනයක ම සිටියි.
    (iv) මාධ්‍ය සන්දේශ වාරණයට ලක් කරයි.
    (v) ග්‍රාහකයන්ගේ යහපත මෙන් ම අයහපත සඳහා ද බලපායි.

50. සමූහ සන්නිවේදනයක දී පුද්ගලයකුගේ සන්නිවේදන හැකියාවට අවම ලෙස අදාළ වන්නේ,
    (i) සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව
    (ii) ඉවසීම හා සංයමය
    (iii) තොරතුරු ඉදිරිපත් කිරීමේ කුසලතාව
    (iv) පුද්ගල පෞරුෂය
    (v) සන්නිවේදනය පිළිබඳ න්‍යායාත්මක දැනුම

Artsapi.lk